# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1947/25 - 2015 දෙසැම්බර් මස 30 වැනි බදාදා - 2015.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xiv).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20(4) වැනි වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20 (4) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, ශ්‍රී ලංකාවේ, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පරිපාලන කටයුතු බරපතල ලෙස අවුල් වී ඇති බවට සහ එම විශ්වවිද්‍යාලයේ බලධාරීන් විසින් එම විශ්වවිද්‍යාලයේ කටයුතු යථා තත්ත්වයට ගෙන ඒමට අපොහොසත් ව ඇති බවට ද සෑහීමකට පත් වීමෙන් පසු, එකී පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියමයක්, නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ ශ්‍රී ලංකාවේ, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත පිරිනමන ලද, පනවන ලද හෝ පවරන ලද පිළිවෙලින් යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ හෝ කිරීමේ කාර්යය සඳහා එකී උපකුලපති වෙනුවට නිසි බලධරයා වශයෙන් මහාචාර්ය උමා කුමාරස්වාමි, 2016 ජනවාරි මස 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙම නියමය මගින් පත් කරමි.

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 23 වැනි දින.
කොළඹ දී ය.

01 - 533